රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 29/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1988 අගෝස්තු මස 30 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**රට තුළ ඇතිවන කලබල නිසා නිශ්චල දේපලවලට හානි සිදුවන සහ/හෝ චංචල දේපල අහිමි වන රජයේ නිලධාරීන්ට වැටුප් අත්තිකාරම් - ආයතන සංග්‍රහය XXIV වන පරිච්ඡේදය.**

---

පහත දැක්වෙන පරිදි 14 වන වගන්තිය එකතු කරන්න;

" 14. රට තුළ ඇතිවන කලබල නිසා නිශ්චල දේපලවලට හානි සිදුවන සහ/හෝ චංචල දේපල අහිමි වන රජයේ නිලධාරීන්ට වැටුප් අත්තිකාරම්.

14:1 රටේ ඕනෑම පෙදෙසක ඕනෑම අවස්ථාවක සිදුවන කලබලයක් නිසා සිය නිශ්චල දේපලවලට හානි සිදුවන සහ/හෝ චංචල දේපල අහිමි වන රජයේ නිලධරයෙකු (කලත්‍රයන් දෙදෙනාම රජයේ නිලධාරීන් වන විට ඒ එක් එක් අයට වෙන වෙනම ද) සඳහා, එම කලබලය එවැනි අනුග්‍රහයක් ලබාදීමට සුදුසු බවට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් තීරණය කළ විට,

(I) වැටුප් අත්තිකාරම ඉල්ලුම් කරන දිනට වර්ෂ 10 ක (දහයක) අවම සේවයක් සහිත, සේවයේ ස්ථිර කරන ලද රජයේ නිලධාරියෙකුට උපරිම වශයෙන් වර්ෂ 2 ක (දීමනා හැර) නව ඒකාබද්ධ වැටුප දක්වා අත්තිකාරමක්, හෝ

(II) වර්ෂ 10 කට (දහයකට) අඩු සේවා කාලයක් සහිත සේවයේ ස්ථිර කරන ලද රජයේ නිලධාරියෙකුට උපරිම වශයෙන් වර්ෂයක (දීමනා හැර) නව ඒකාබද්ධ වැටුප දක්වා අත්තිකාරමක්;

(ආ) ආපසු ගෙවීමේ කාලය වර්ෂ 8 ක් (අටක්) නොඉක්මවිය යුතුය;

(ඇ) අය කළ යුතු පොළිය සියයට 7.2 ක් ( හතයි දශම දෙකක්) විය යුතුය;

(ඈ) ස්ථිර කරන ලද රජයේ නිලධරයන් දෙදෙනෙකු පුද්ගලික වගයෙන් ඇප විය යුතුය; (යෝජිත ඇපකරුවන් දෙදෙනාම ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව සුදුසු විය, යෝග්‍ය විය, පුද්ගලයන් බවට ණය අනුමත කරන බලධාරියා සෑහීමකට පත්විය යුතු වේ.)

(ඉ) අත්තිකාරම් ලාභියා වයස අවුරුදු 55 වන විට ණය ප්‍රමාණය හා පොළිය සම්පූර්ණයෙන් අයකර ගත හැකි වන පරිදි අත්තිකාරම් මුදල හෝ වාරිකය හෝ තීරණය කළ යුතුය;

(ඊ) විශ්‍රාම ගැනීමට පෙර ණය මුදල ගෙවා අවසන් කරන බවට හෝ විශ්‍රාම ගන්නා අවස්ථාවේදී තම විශ්‍රාම වැටුප පරිවර්තනය කර, ආපසු ගෙවීමට ඇති ණය ශේෂයක් වෙතොත්, එම ශේෂය තමාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය දෙන බවට හෝ, අවලංගු කළ නොහැකි පොරොන්දුවක් මත, වයස 55 ආසන්න නිලධාරියෙකුට ද වැටුප් අත්තිකාරම ගෙවිය හැකිය. ආයතන සංග්‍රහයේ 23 වන පරිශිෂ්ටයේ දැක්වෙන ආකෘති පත්‍රය අවලංගු කළ නොහැකි පොරොන්දුව සඳහා යොදා ගත යුතුවේ.

වැටුප් අත්තිකාරම ආපසු ගෙවීම වර්ෂ 8 කට නොවැඩි කාලයක් ඇතුළත කරන්නේය යන පදනම මත වාරිකය ගණනය කිරීම ගැන විරුද්ධත්වයක් නැත.

සහ (උ) වයස අවුරුදු 55 එළඹීමට පෙර ණයකරු මියගිය හොත්/ [illegible] නිසා හෝ සේවයෙන් විශ්‍රාම ගියහොත්, එම සිද්ධිය සිදුවන අවස්ථාවේදී ණය මුදල හා පොලියෙන් නොගෙවා ඉතිරිව තිබෙන ප්‍රමාණය ණයකරුගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් හෝ පූර්වයෙන් අයකර ගත යුතු මුදලක් හැටියට සැළකිය යුතුය.

12 (අ) මෙම අත්තිකාරම් මුදල රජයේ නිලධාරියෙකුට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ කලින් දී ඇති ණය මුදලක් වේ නම් ඒවාට අතිරේක වූත් වෙනස් වූත් එකක් වේ.

14:2 (අ) මෙම අත්තිකාරම් මුදල රජයේ නිලධාරියෙකුට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ කලින් දී ඇති ණය මුදලක් වේ නම් ඒවාට අතිරේක වූත් වෙනස් වූත් එකක් වේ.

(ආ) අත්තිකාරම් ලාභියා සහ ඇපකරුවන් මු.රෙ. 238 සහ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3 වන වගන්තියෙහි දැක්වෙන 40% හෝ $33\frac{1}{3}$% අඩු කිරීම් සීමාවෙන් නිදහස් ය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 237,250,313,358, 381 සහ 386 යටතේ කලින් වැටුප් අත්තිකාරමක් ලබාගෙන ඇති නිලධාරියෙකුට ද, යළිත් වරක් එවැනි දේපල හානියක් සිදුවුයේ නම්, මෙම චක්‍රලේඛය යටතේ, ලබාගත හැකි අත්තිකාරම හා කලින් ලබාගත් අත්තිකාරමෙන් නොගෙවා ඉතිරිව ඇති ප්‍රමාණය අතර වෙනස ගෙවිය හැකිය.

14:3 මෙම අත්තිකාරම සඳහා ආයතන සංග්‍රහයේ 29 වන පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘති පත්‍රය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම ආකෘති පත්‍රයේ පිටපතක් මෙම චක්‍රලේඛයට අමුණා ඇත.

14:4 ගිවිසුම සහ ඇප බැඳුම්කරයට පිළිවෙලින් රු: 1 ක් සහ රු: 10 ක් වටිනාකම් ඇති මුද්දර ඇලවිය යුතුය.

14:5 මාණ්ඩලික නිලධාරියෙකුගේ වැටුප් අත්තිකාරම අමාත්‍යාංශයේ ලේකම් ද, සෙසු නිලධරයන්ගේ වැටුප් අත්තිකාරම් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාද අනුමත කළ යුතුය.

14:6 රජයේ නිලධරයන්ට අත්තිකාරම් දීම සඳහා එක් එක් දෙපාර්තමේන්තුවේ ඇති අත්තිකාරම් ගිණුම් මගින් මෙම වැටුප් අත්තිකාරම ක්‍රියාත්මක කළ යුතුය.

14:7 අවශ්‍ය අවස්ථාවන්හිදී මුදල් රෙගුලාසි 503 සහ 1983.02.18 හා අංක:19 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය අනුව සියළුම රජයේ දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.

14:8 ආපසු අයකරන මුලික මුදලේ වාරිකය, මෙම අත්තිකාරම් ගෙවන "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් මුදල් ගිණුම - 'බී' ගිණුම" ට බැර කළ යුතුය. අය කරන පොළිය, ආදායම් ශීර්ෂ 5; කුලී, පොළී ලාභ හා ලාභාංශ ලැබීම්, උප ශීර්ෂ 2 පොළී විෂය අංක 4, අනිකුත් යන ආදායම් ශීර්ෂයට බැර කළ යුතු අතර, වෙනම ගිණුම් ගත කළයුතුය.

14:10 පිටරට-මාරු කෙරෙන නිලධාරියෙකු සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුමෙන් දෙන අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමේ සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතුය. එනම්, අත්තිකාරම් මුදලේ ආපසු ගෙවීමට ඇති ශේෂය, "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් - 'බී' ගිණුම" ට හර කරමින්, නිලධාරියා ලබාගන්නා දෙපාර්තමේන්තුව නිලධාරියා මුදාහරින දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. ඉන් පසුව ණය වාරික කොටස් දිගටට අයකර ගත යුතු අතර, කෙසේ හෝ නියමිත දින වන විට සම්පූර්ණ අත්තිකාරම් මුදල අයකර ගැනීමට වගබලා ගත යුතුය.

14:11 මෙම වැටුප් අත්තිකාරම ලබා ඇති නිලධරයෙකුගේ සේවය අවසන් කළහොත්, ණය මුදලින් එතෙක් නොගෙවා ඇති ශේෂය (සමාන පොළිය ද සහිතව) එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන්/ඇප මුදලෙන්/පාරිතෝෂිකයෙන් හෝ නීත්‍යානුකූලව එවැනි අය කිරීමක් කළහැකි, ඔහුට ගෙවිය යුතුව ඇති වෙනත් මුදල්වලින් හෝ අයකර ගැනීමට ගෙවීම් සහ ආයතන ඒකක වගබලා ගත යුතුය.

14:12 මෙම ප්‍රතිපාදන 1987.01.01 දින සිට ක්‍රියාත්මක වේ."

රාජ්‍ය සංස්ථා ද, එම කාර්ය සඳහා මුදල් ලබාගන්නා මාර්ගය පිළිබඳව නිසි සැලකිල්ල යොමු කොට සමාන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන)

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

29 වැනි පරිශිෂ්ටය.

(XXIV - 14:3 )

රට තුල ඇතිවන කලබල නිසා නිශ්චල දේපල වලට හානි සිදුවන සහ/හෝ චංචල දේපල අහිමි වන රජයේ නිලධාරීන්ට වැටුප් අත්තිකාරම් සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය.

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම:-

2. තනතුර:-

3. කාර්යාලීය ලිපිනය:-

4. වාර්ෂික වැටුප:- (දීමනා රහිතව)

5. ඉල්ලා ඇති මුදල රු:-

6. ඉල්ලුම්කරු විසින් ගණන් බලා ඇති පරිදි හානිය, රු: -

7. නිශ්චල දේපල සඳහා හානිය සහ/හෝ චංචල දේපල අහිමිවීයාම සහ එම හානියේ ප්‍රමාණය සනාථ කරන ලියකියවිලි:-

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:-